# 09 ගී රස වින්දන

'ගීතය' මහත් සේ ජනප්‍රියත්වයට පත් ව ඇති කලා මාධ්‍යයකි. මියුරු ගී පද මාලාවක් සංගීතය සමග මුසු වෙමින් ගායන ශිල්පියෙකුගේ හෝ ශිල්පිනියකගේ මධුර ස්වරයෙන් ගැයෙන ගීතයක් ලෙස අපගේ දෙසවන වැකෙද්දී අපි ඉන් මිහිරි රසයක් විඳිමු. ඒ මිහිර නිසා ම එම ගීතය නැවත නැවත ඇසීමට ප්‍රිය කරමු. එම ගීතයේ පදවැල් මුමුණා කීමට උත්සාහ ගනිමු. දිගු කල් මතකයේ රැඳෙන එබඳු ගීත අපට සතුට හා ආස්වාදය ගෙන දෙන්නේ ය.

ජනකාන්ත කලාවක් වන ගීතය අසා රස විඳිය යුත්තකි. එබැවින් එහි මූලික අංගයක් වන්නේ අර්ථවත්වූත්, ශ්‍රවණ රමණීයවූත් පද මාලාවක් තිබීමයි. ගීතයක පදමාලාව සංගීත ස්වර රචනාවක් මත පිහිටා ගායනා කළ හැකි කාව්‍යමය නිර්මාණයක් විය යුතු ය. ඒ අනුව ගීතයක තවත් වැදගත් අංගයක් වන්නේ සංගීතය යි. එයින් පද මාලාවේ අර්ථයට උචිත රිද්මානුකූල සංගීත රටාවක් නිර්මාණය වෙයි. සංගීතය සමග මුසු වූ පද මාලාව ගායනා කිරීමෙන් එය ගීතයක් බවට පත් වෙයි. මේ අනුව කවියා, සංගීතඥයා සහ ගායකයා යන නිර්මාණකරුවන්ගේ දායකත්වයෙන් '**ගීතය**' යන කලා නිර්මාණය බිහි වෙයි.

අපි දැන් එබඳු ගීතයක රස විඳිමු.

**රැක්අත්තන මල මුදුනේ**
**බඹරු නටන හැන්දෑවේ**
**සැඳෑ අඳුර පිය මං කර**
**කවුරුද එන්නේ....**
**පුතුනි බලන් යොමා නුවන්**
**කවුරුද එන්නේ**

**මුතු පිනි දැල් සැලෙන උදේ**
**උදා දිමුතු හිරු එළියේ**
**පුතු සවනට රහස් කියා**
**පිය මං කරලා**
**අප වෙනුවෙන් දවස ගෙවා**
**වෙහෙසී එන්නේ**

**රැක්අත්තන මල මුදුනේ**
**බඹරු නටන හැන්දෑවේ...**

**පතොක් වැටිය උඩින් ඇදී**
**දිවයුරු මිය යන මොහොතේ**
**පුරා හඳක් සේ ඈතින්**
**කවුරුද එන්නේ**
**පුතුනි බලන් යොමා නුවන්**
**කවුරුද එන්නේ**

| | | |
|---|---|---|
| ගී පද රචනය | : | මහින්ද අල්ගම |
| තනු නිර්මාණය සහ ගායනය | : | විශාරද නන්ද මාලනී |

සැඳෑ අඳුර පැතිරෙමින් පවතින හෝරාවයි. මිදුලේ රුක්අත්තන මල් පිපී ඇත. බඹරු මල්වල පැණි උරමින් ප්‍රීති වෙති. විඩාබර දවස ගෙවී පහන් සිතිවිලි පහළ වන අවස්ථාව යි. අඳුර පැතිරෙන්නට පෙර සැමියා නිවසට පැමිණීම බිරියගේ අපේක්ෂාවයි. දුර දී ම ඔහු එනු දකින ඇය ප්‍රසන්න හැඟීමකින් සහ උතුරා යන සෙනෙහසකින් ඔහු පිළිගැනීමට මිදුලට බසින්නේ දරුවා ද වඩාගෙන ය. "**අන්න බලන්න පුතේ, කවුද එන්නේ කියලා**" යි පවසමින් ඇඟිල්ල දිගු කරමින් දරුවාට පියා පෙන්වන්නේ මහත් සතුටකිනි. මේ සුලබ අත්දැකීම අර්ථ පූර්ණ, භාව පූර්ණ රසවත් ගීතයක් බවට පරිවර්තනය වී ඇති ආකාරය බලන්න.

මෙම ගීතය ඇසෙන විට ඉහත කී අත්දැකීම නිතැතින් ම ඔබේ මතකයට නැගෙනු ඇත. මවකගේ මුවින් පෙර ඔබ ඇසූ වදන් යළි අපූර්වාකාරයෙන් ඔබේ සවන් තුළ රැව් දෙනු ඇත. පිය සෙනෙහස හා බැඳුණු දයාබර හැඟීම් ඔබේ සිත තුළ අවදි වේ. සෙනෙහස, ආදරය, දයාව, අනුකම්පාව වැනි සුන්දර හැඟීම් කැටිකොට ගත් අපූර්ව අත්දැකීමක් බවට කවියා එම අවස්ථාව පත් කොට ඇති ආකාරය ඔබේ හදවතට දැනෙනු ඇත. ආරම්භක කොටසින් හෙවත් 'ස්ථායී' කොටසින් පරිසරය ද සම්බන්ධ කර ගනිමින් ප්‍රියමනාප අත්දැකීමක් ප්‍රකාශ කිරීමට උචිත ප්‍රවේශයක් ලබා ගෙන ඇත.

**රුක්අත්තන මල මුදුනේ**
**බඹරු නටන හැන්දෑවේ**
**සැඳෑ අඳුර පිය මං කර**
**කවුරු ද එන්නේ**
**පුතුනි බලන් යොමා නුවන්**
**කවුරු ද එන්නේ**

උතුරා යන සතුටින් මවකගේ මුවින් පිට වන වදන් මාලාවක් ලෙස මෙය ගැයෙයි. "**කවුරු ද එන්නේ**" "**කවුරු ද එන්නේ**" යන යෙදුම ගීතය පුරා ම අසන්නට ලැබෙයි. එම පුනරුක්තිය ගීතයේ අර්ථය ප්‍රබල ලෙස කියා පෑමට උචිත ප්‍රකාශයක් වී ඇත. එන්නේ කවුරුන් ද යි ගීතයේ කොතැනකවත් සඳහන් වන්නේ නැත. එහෙත් ඒ එන්නේ පුතුගේ දයාබර පියාණන් බව ධ්වනිත ය. "**පුතුනි බලන් යොමා නුවන්**" යනුවෙන් පුතුගෙන් කරන ඉල්ලීම රසිකයන් වන අපට ද කරන ආරාධනාවක් වැන්න.

පියා උදයේ නිවසින් පිට වී ගිය ආකාරයත්, සවස නිවසට පැමිණෙන ආකාරයත් ගීතයේ දෙවන කොටසින් නිරූපණය වේ. උදය ප්‍රබෝධවත් ය. දීප්තිමත් උදා හිරු එළියේ මුතු වැනි පිනි දැල් සැලෙන අතරේ පුතු සිඹ සනසා සමු දී පිට වී යන පියා දවස පුරා වෙහෙසී දවසේ මෙහෙවර නිමවා ගෙදර එන වෙලාවයි මේ. අම්මා පුතුට කියන්නේ පියා **"අප වෙනුවෙන් දවස ගෙවා වෙහෙසී"** එන බවයි. එම ප්‍රකාශයෙන් බිරියක වශයෙන් ඇය සිය සැමියා කෙරෙහි දක්වන අසීමිත වූ අනුකම්පා සහගත දයාබර ආකල්පය මනාව ධ්වනිත වෙයි. ගෞරව පූර්වක ව කෘතවේදී ව තම සෙනෙහෙබර පියා දෙස බලන ලෙසයි, ඇය පුතුට ප්‍රකාශ කරන්නේ.

ගීතයේ අවසාන කොටසින් ඒ දයාබර බව තවදුරටත් කුළු ගැන්වෙයි. හිරු බැස යයි. සඳ නැගෙයි. පියාගේ සම්ප්‍රාප්තිය නිවසට පුරා හඳක් පායා එන්නාක් බඳු ය. මෙහි හිරු බැස යෑම පිළිබඳ ව ප්‍රකාශ කරන,

**"පතොක් වැටිය උඩින් ඇදී**
**දිවයුරු මිය යන මොහොතේ"**

යන යෙදුම අතිශයින් රූපකාර්ථවත් ය. එහි දී ව්‍යංග්‍යයෙන් පැවසෙන දේ බොහෝ ය. පතොක් වැටිය අතිශයින් කර්කශ ය; විසකුරු කටු සහිත ය. හිරු බැස යන්නේ එබඳු වූ පතොක් වැටිය උඩින් ඇදී ය. මෙහි '**පතොක් වැටිය**' ජීවිතයේ කටුක බව නිරූපණය කරන ප්‍රබල සංකේතයකි. සූර්ය රශ්මිය ද චණ්ඩ ය; දැඩි තාපය ඇති කරන්නකි. සැඩ හිරු රැස් හකුළා ගෙන හිරු බැස යන මොහොත ප්‍රකාශ කරන්නේ 'දිවයුරු මිය යන මොහොතේ' යන කාව්‍යෝක්තියෙනි. අනන්ත අප්‍රමාණ දුක් කම්කටොලු හේතුවෙන් පීඩාවට, වේදනාවට, තැවීමට පත්වන ඔවුන්ගේ ජීවිතයට සැනසුම, සතුට ගෙන දෙන්නේ පියා ය. ඒ බව ප්‍රකාශ කරන්නේ ද අතිශයින් උචිත උපමාවකිනි.

**"පුරා හඳක් සේ ඈතින් එන්නේ"**

යන කාව්‍යෝක්තිය අනුව පියා නිවසට පැමිණීම පුරා හඳක් පායා ඒමකි. සඳ එළිය කාන්තිමත් ය. සෞම්‍ය ගුණයෙන් යුක්ත ය. සිසිල ගෙන දෙන්නේ ය. මන නුවන් පිනවන සුන්දරත්වයෙන් යුක්ත ය. ප්‍රසාද ගුණයෙන් සහ ඖචිත්‍යයෙන් යුතු එම උපමාවෙන් ප්‍රස්තුතයට අදාළ ව උතුරා යන සෙනෙහස, ආදරය, දයාව වැනි හැඟීම් කුළු ගැන් වේ.

අර්ථවත් අත්දැකීමක් උචිත පද මාලාවක් යොදා ගෙන රසවත් ගීතයක් බවට පත් කිරීමට කවියාගේ නිර්මාණ කුසලතාව හා භාෂා කුසලතාව හේතු වේ. පද මාලාවෙන් මතු වන ශබ්ද රසය හා අර්ථ රසයත් රසික සිත්හි ආනන්දයත් ප්‍රඥාවත් ජනිත කිරීමට සමත් වෙයි. කවරකුට වුව ද වින්දනයක් ලබා ගත හැකි මෙම ගීතයේ ගැඹුරු ජීවන දර්ශනයක් ඇතුළත් වී තිබීම ද විශේෂත්වයකි.

මෙහි දී එක් අතකින් පිය සෙනෙහස ගැන කියවෙන අතර තවත් අතකින් පතිනියකගේ පතිභක්තිය ගැන ද කියැවෙයි.

වර්තමාන ව්‍යවහාර භාෂාව සාර්ථක ලෙස යොදා ගෙන ඇති මෙහි අපූරු පද සංයෝජනයක් දක්නට ලැබෙයි. සංක්ෂිප්ත බව රැක ගනිමින් අත්දැකීමෙහි අර්ථය පරිපූර්ණ ලෙස ප්‍රකාශ කිරීමට උචිත ධ්වනිතාර්ථවත් බස් වහරක් යොදා ගැනීමට ගීත රචකයා සමත් වී ඇත.

**"බඹරු නටන හැන්දෑවේ"**
**"මුතු පිනි දැල් සැලෙන උදේ"**
**"පතොක් වැටිය උඩින් ඇදී දිවයුරු මිය යන මොහොතේ"**
**"පුරා හඳක් සේ"**

ආදි යෙදුම්වලින් මතු වන ධ්වනිය ගීතයේ අර්ථය උද්දීපනය කිරීමට බෙහෙවින් හේතු වී ඇත.

අප මෙතෙක් අවධානය යොමු කළේ මෙම ගීතයේ පද මාලාවේ සාහිත්‍යමය පක්ෂය පිළිබඳවයි. අර්ථ පූර්ණ, භාව පූර්ණ ගීතයක් බවට පත්වීමට නම් ගීතයේ සංගීත ස්වර සංයෝජනය ද ඉහළ මට්ටමක තිබිය යුතු වෙයි. ගීතයේ තේමාව සමග අවියෝජනීය ලෙස බැඳුණු තනු නිර්මාණයක් තිබීම මෙහි සාර්ථකත්වයට හේතුවකි. අපගේ සමාජ සංස්කෘතික පරිසරය හා බැඳුණු සාරධර්ම මතු කරන අත්දැකීමක් පදනම් කරගත් මෙම ගීතයේ අර්ථය තවදුරටත් පෝෂණය කිරීමට ගී තනු නිර්මාණය සමත් වී ඇත. ගීතයේ පදමාලාව තුළින් ම දේශීය නාද රටාවක් නිර්මාණය වී ඇත. එයින් මතු වන ලයාන්විත රිද්මය හැඟීම් දනවමින් ගීතයේ අර්ථය වඩාත් ඉස්මතු කිරීමට සමත් වී ඇත. ශබ්ද මාධුර්යය හා අර්ථ මාධුර්යය මගින් ප්‍රස්තුතයට අදාළ හැඟීම් දනවමින් ශ්‍රාවකයාට ආස්වාදය ලබා දීමට සුදුසු ගීතයක් නිර්මාණය වී ඇත. ගීතය සඳහා යොදා ගෙන ඇති ශ්‍රවණ රමණීය නාද මාලාව ශ්‍රාවකයා ඇදබැඳ තබා ගැනීමට සමත් වී ඇත.

දේශීය අනන්‍යතාව සහිත ජනකාන්ත කටහඬකින් ගායනා කරනු ලැබීම ගීතයේ සාර්ථකත්වයට හේතු වී ඇති අනෙක් ප්‍රබල සාධකයයි. මවකගේ සතුටු සහගත හැඟීම් ප්‍රකාශ කිරීමක් ලෙස ගැයෙන ගීතයේ අර්ථය අපගේ සිතට කාවදින්නේ ගායිකාවගේ මධුර වූ ගායනා විලාසය හේතුවෙනි. ඉහත කී කරුණු අනුව පද රචනය ස්වර රචනය හා ගායනය යන ත්‍රිත්වය විශිෂ්ට ලෙස සුසංයෝජනය වූ ද අසන්නාගේ අමන්දානන්දයට හේතු වූ ද උසස් ගණයේ ලා සැලකිය හැකි ගීතයක් ලෙස මේ ගීතය අගය කළ හැකි ය.

අරුත් පැහැදිලි කිරීම

| | | |
|---|---|---|
| අමන්දානන්ද | = | (අමන්ද+ආනන්ද) නොමඳ සතුට |
| අර්ථ පූර්ණ | = | අර්ථයෙන් පිරුණු |
| අර්ථ මාධුර්යය | = | අර්ථයෙහි ඇති මිහිරි බව |
| අවියෝජනීය | = | වෙන් කළ නො හැකි, (අ+වියෝජනීය) |
| ඖචිත්‍යය | = | උචිත බව |
| කාව්‍යෝක්තිය | = | කවි කියමන, (කාව්‍ය+උක්තිය) කාව්‍ය රසය ගැබ් කොට ගත් |
| පුනරුක්තිය | = | නැවත නැවත කීම |
| භාව පූර්ණ | = | හැඟීම්වලින් පිරුණු |
| මාධුර්යය | = | මධුර බව/මිහිරි බව |
| ව්‍යංග්‍යාර්ථ | = | වචනයෙන් කියවෙන අර්ථය ඉක්මවා මතුවන අර්ථ |
| ශබ්ද මාධුර්යය | = | ශබ්දයේ මිහිරි බව |
| ශ්‍රැති රමණීය | = | ඇසීමට ඇල්ම ඇති කරන |
| සුසංයෝජනය | = | මනා වූ ගැළපීම |

## ක්‍රියාකාරකම 01

**පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

i ‘**ගීතය**’ සාමූහික කලා නිර්මාණයක් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න.

ii උසස් ගණයේ ගීතයක තිබිය යුතු ගුණාංග මොනවා ද?

iii ගීතය සම්බන්ධයෙන් සංගීතඥයාගේ කාර්ය භාරය විස්තර කරන්න.

iv පාඩමෙහි ඇතුළත් ගීතයේ ඇති ව්‍යංග්‍යාර්ථවත් යෙදුම් පැහැදිලි කරන්න.

v පාඩමේ ඇතුළත් ගීතයේ ඔබ සිත් ගත් අවස්ථාවක් තෝරා ගෙන එසේ තෝරා ගැනීමට හේතු වූ කරුණු දක්වන්න.

vi වැඩ නිමවා තාත්තා ආපසු ගෙදර එන අවස්ථාවේ දරුවකුගේ සිතෙහි පහළ වන හැඟීම් ලියා දක්වන්න.

## ක්‍රියාකාරකම 02

පාසලේ සාහිත්‍ය සංගමය මගින් ‘**ගී රස වින්දන**’ වැඩසටහනක් සංවිධානය කොට ක්‍රියාත්මක කරන්න.

## ක්‍රියාකාරකම 03

පන්තිය කණ්ඩායම්වලට බෙදී රසවත් ගීතය බැගින් තෝරා ගෙන එය ගායනා කොට ඒ පිළිබඳ ව රසාස්වාදයක් ද කරමින් සංවාද මණ්ඩපයක් ක්‍රියාත්මක කරන්න.

## ක්‍රියාකාරකම 04

‘**පැරණි රසාංග**’ නමින් සංගීත වැඩ සටහනක් ඉදිරිපත් කරමින් එදා සහ අද ගීතයේ ගමන් මග ගැන සාකච්ඡාවක් මෙහෙයවන්න.